# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## <u>උපකුලපති තනතුර සඳහා</u>
## <u>අයදුම්පත් කැඳවීම</u>

මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත) 34වන වගන්තිය සහ 2023 අප්‍රේල් මස 10වන දිනැති අංක 03/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව, මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින්, ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු විය යුතු අතර, එහි ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද වේ. ඔහු/ඇය පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් පත්වන සාමාජිකයෙකු සහ එහි සභාපතිවරයා ද වේ. තවද, ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිලධාරියා ද වනු ඇත.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත) විධිවිධාන ප්‍රකාරව උපකුලපතිවරයා ඔහුට/ඇයට නියමිත කාලයට පෙර ධුරයෙන් ඉවත් වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, වසර තුනක (03) කාලයක් සඳහා හෝ ඔහුට/ඇයට වයස අවුරුදු හැටපහ (65) සම්පූර්ණ වන තෙක්, යන අවස්ථා දෙකෙන් ප්‍රථමයෙන් එළඹෙන අවස්ථාව දක්වා ධුරය දරනු ලබයි.

විශ්වවිද්‍යාලය සඳහා උපායමාර්ගික අධ්‍යයන නායකත්වය සැපයීම, විශ්වවිද්‍යාලය තුළ විධිමත් කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය, සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද උපකුලපතිවරයා වගකිව යුතු වේ. ඔහු/ඇය විසින් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු අධීක්ෂණය කළ යුතු අතර, අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, යහපාලනය සහ අපක්ෂපාති ඵලදායී නායකත්වය යන මූලධර්ම සුරැකීමට සහ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වේ.

අයදුම්කරුවන්හට විශිෂ්ට අධ්‍යයන පසුබිමක් සහ ප්‍රබල පර්යේෂණ පැතිකඩක් තිබිය යුතුය. විවිධ පාර්ශවකරුවන් සමඟ සාධනීයව සහ අපක්ෂපාතීව කටයුතු කිරීම සඳහා අවශ්‍ය සුවිශේෂී අන්තර් පුද්ගල නිපුණතා මෙන්ම, තහවුරු වූ නායකත්ව සහ කළමනාකරණ හැකියාවන් ඔහු/ඇය සතු විය යුතු ය. ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ මනා අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඇති කැපවීම අත්‍යවශ්‍ය වේ. තවද, අපේක්ෂකයා විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර සහ මූලික වටිනාකම් පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුක්ත විය යුතුය. විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු එහි නිල වෙබ් අඩවිය වන **http://www.uom.lk** වෙත පිවිස ලබා ගත හැක.

උපකුලපතිවරයා ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයෙහි පිහිටවනු ලබන අතර, පවතින නීති සහ රෙගුලාසිවලට අනුව මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවකට සහ එම තනතුරට අදාළ අනෙකුත් දීමනාවලට ද හිමිකම් ලබනු ඇත.

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 63ට අඩු විය යුතු ය. අයදුම්කරුවන් නිසි පරිදි අත්සන් කරන ලද අයදුම්පත, පහත සඳහන් ලේඛන ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

1. **අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව සමඟ උපන් දිනය සහ පුරවැසිභාවය සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක් හෝ වෙනත් ඕනෑම සනාථ කිරීමේ ලේඛනයක්.**
2. **විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා වූ දැක්ම පිළිබඳ ප්‍රකාශනයක් සහ උපකුලපති ධුරයට පත්වුවහොත් තමන් ඉටු කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්.**
3. **දැනට ධුරය හොබවන උපකුලපතිවරයා හෝ මීට පෙර එම විශ්වවිද්‍යාලයේ ම උපකුලපති ධුරය දරා ඇති අයෙකු අයදුම්කරුවෙකු වන අවස්ථාවක, ඉහත අංක 1 සහ 2 හි සඳහන් ලේඛනවලට අමතරව, ඔහුගේ / ඇයගේ පළමු ධුර කාලය තුළ සාර්ථක ලෙස ඉටුකළ සේවාවන් උද්දීපනය කෙරෙන වාර්තාවක්.**

4. මොරටුව විශ්වවිද්‍යාලයේ නොවන වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයක, සංස්ථාවක හෝ ඕනෑම රාජ්‍ය අංශයේ ආයතනයක සේවය කරන අයෙකු අයදුම්කරු වන අවස්ථාවක, අදාළ තනතුරට පත්වුවහොත් ඔහු / ඇය නිදහස් කළ හැකි ද යන්න සඳහන් කරමින් සේවායෝජකයා විසින් නිකුත් කරන ලද ලිපියක්.

අයදුම්පත් **2026 අප්‍රේල් 21වන දින පස්වරු 3.00 ට හෝ ඊට පෙර ලේඛකාධිකාරී, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව, 10400** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් මාර්ගයෙන් හෝ ලැබෙන ලෙස එවිය යුතු හෝ පැමිණ ලේඛකාධිකාරී වෙත භාරදිය යුතුය. අයදුම්පත සහ අදාළ ලේඛන අඩංගු ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ "උපකුලපති තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. **මීට අමතරව, ඉහත ලේඛන සහ අනෙකුත් සියලුම ආධාරක ලේඛන ද සහිත මෘදු පිටපතක් PDF ආකෘතියෙන්** applications-vc@uom.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය.

ඇගයීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ විශේෂ රැස්වීම හමුවට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් විසින් කෙටි ඉදිරිපත් කිරීමක් කළ යුතුය. එම ඉදිරිපත් කිරීම අවම වශයෙන් මිනිත්තු දහයක (10) කාලයකින් යුක්ත විය යුතු අතර මිනිත්තු පහළොවකට (15) නොවැඩි විය යුතු ය.

උපකුලපති තනතුර සඳහා තේරීම, **2023 අප්‍රේල් මස 10වන දිනැති අංක 03/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ** දක්වා ඇති පරිදි සිදු කරන අතර, එය **https://www.ugc.ac.lk/attachments/2442_Commission%20Circular%20No.%2003-2023.pdf** යන සබැඳිය වෙත ප්‍රවේශ වීමෙන් ලබා ගත හැකි ය.

මෙම දැන්වීම සම්බන්ධයෙන් වන යම් පැහැදිලි කිරීමක් හෝ ගැටලුවක් වෙතොත් ඒ පිළිබඳව මොරටුව විශ්වවිද්‍යාලීය පාලක සභාවේ තීරණය අවසාන තීරණය වේ . අංක 03/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ කරුණු පිළිබඳ යම් අර්ථ නිරූපණයක් හෝ එම චක්‍රලේඛයේ අදාළත්වය පිළිබඳව වන ඕනෑම කරුණක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

**ඩී.එල්. ඩිෂාන් ජයන්ත**
ලේඛකාධිකාරී
පාලක සභාවේ ලේකම්
මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
2026.03.15